# 2004 වසරේ විශිෂ්ඨ නිපැයුම්

## විශිෂ්ඨතම නිපැයුම Space Ship One




2004 වසරේ විශිෂ්ඨතම නිපැයුම ලෙස ටයිම් සඟරාව නම් කරනු ලැබුවේ Space Ship One අභ්‍යවකාශ යාතාවය. අනාගතයේ සිදුවිය හැකි සුවිශාල පෙරළියක පෙර නිමිති පාමින් මේ අති දක්ෂ සැලසුමේ නිර්මාණ ශිල්පියා වූයේ ඇමරිකානු ජාතික Burt Rutan ය.

පසුගිය ඔක්තෝබර් මාසයේ දී කැලිෆෝනියාවේ Mojave හී සිට White Knight නමැති මව් යානයේ ආධාරයෙන් අභ්‍යවකාශගාමීන් දෙදෙනකු සමග මෙය ප්‍රථමවරට ගුවන් ගත වූ අතර, පැයක ගමනකින් පසු මීටර් 14,600 උසක දී මව් යානය මඟින් මුදාහරිනු ලැබීය. ඒ අනුව පැය 1 විනාඩි 30 ක සාර්ථක ගමන් වාරයක් නිම කිරීමට Space Ship One යානය සමත් විය.

මෙම කුඩා හුරුබුහුටි අභ්‍යවකාශ යාතාව කාර් රථ 2 ක් ගාල් කළ හැකි ප්‍රමාණයේ ගරාජයක නවතා තැබිය හැකිය. දවසක් හැර දවසක් අභ්‍යවකාශ චාරිකාවක නිරත විය හැකි වීම සුවිශේෂත්වය කි. 2007 වසරේ හඳුන්වාදීමට නියමිත නවමු රටාවක අභ්‍යවකාශ ගමනාගමන යාතාවන් ගේ පළමුවැන්න Space Ship One ලෙස හඳුන්වා දිය හැකිය. පසුගිය ජූනි මාසයේ දී සාදා නිම කළ Space Ship One ඔක්තෝබර් මාසයේ දී සති දෙකක් ඇතුළත දෙවරක් අභ්‍යවකාශගත වූ ප්‍රථම පෞද්ගලික අභ්‍යවකාශ යාතාව ලෙස ඩොලර් මිලියන 10ක Ansari x ත්‍යාගය ද දිනා ගත්තේය.

*(විස්තර කවරයේ ඇතුළු පිටුවේ)*



## සංචාරක නියමුවා

මාර්ග සිතියම්, මඟ පෙන්වන්නන්, සංචාරයේ යෙදෙන්නන්ට මින් මතු අවශ්‍ය නොවනු ඇත. "Go Car" යනු ඔබ හමුවට පැමිණෙන, රෝද තුනේ, නවතම මඟ පෙන්වන්නාය. මෙහි සවිකර ඇති GPS ක්‍රමය සහිත විශේෂ උපකරණ කට්ටලය මඟින්, ඔබ යා යුතු ස්ථානය පෙන්වා දෙන අතර, කිසියම් ස්ථානයකට පිවිසි කළ ඒ පිළිබඳ විස්තර සපයනු ඇත.

පැයට කි. මී. 56 ක උපරිම වේගයෙන් ගමන් කළ හැකි මෙම රථයෙන් කි. මී. 19 සිට 27 දක්වා වටයක් ගමන් කළ හැකිය. දැනට භාවිතයේ පවතින්නේ සැන්ෆ්‍රැන්සිස්කෝ හි පමණි. පැයක් සඳහා අය කිරීම ඇ. ඩොලර් 40 කි.

නිපදවීම : **"Go Car" Rentals**

වැඩි විස්තර සඳහා : **gocarsf.com**

## හිමේ යන බෝට්ටු




හිමේ මසුන් බෑම (Ice Fishing) විනෝදාංශයක් වුවත්, අනතුරට පත්වීමේ ඉඩකඩ මින් මතුවට අවම වනු ඇත. කුඩා අවදියේ සිටම හිමේ මසුන් බෑම විනෝදාංශයක් වූ "Harry Haney" සිය සහායකයා ගේ මරණයත් සමග වඩාත් ආරක්ෂාකාරී මසුන් බෑමේ ක්‍රමයක් සෙවීමේ ප්‍රතිඵලය, මෙහි දැක්වෙන හිම මත යන බෝට්ටුවයි. ඇලුමිනියම් වලින් තැනූ, දිගින් මීටර 4 ක් වූ මෙය අයිස් කැඩී ගියහොත් ජලයේ පාවන ලෙස සකසා ඇති නිසා, මිනිසුන් අනතුරට පත්වීම වැළකෙනු ඇත. ලබාගත හැක්කේ නවමත් ජායාරූප ආකාරයෙන් පමණි.

නිපදවීම : **Harry Haney**

වැඩි විස්තර සඳහා : **snow-boat.com**



## ගිනි නිවන්නා


එය පෙනුමට ජලය මෙන් ය. පෙරීම, ගලායෑම හැලීම ද සෑම අතින්ම ජලයට සමානය. එහෙත් ඉන් කිසිවක් නොතෙමේ. "3M Novec 1230" නම් වූ මෙය ගිනි ආරක්ෂක දියරයකි. ලැප්ටොප් පරිගණකයක් පවා මෙම අරුම පුදුම දියරයේ ගිල්වා ඉතාමත් හොඳ ක්‍රියාකාරී තත්ත්වයෙන් මෙන්ම වියළීව නැවත ලබාගත හැකිවීම විස්මයකි. කාර්යාලවල, පරිගණක කාමරවල මෙන්ම කෞතුකාගාරයන් හී ගිනි නිවීමට වඩාත් සුදුසු ය.

නිපදවීම : **3M**

වැඩි විස්තර සඳහා : **tycofireandsecurity.com**

## ඇලුම්වෙන පිහිනුම් කණ්ණාඩි

නයික් නාමය යටතේ නිපද වූ මේ අපූරු පිහිනුම් කණ්ණාඩි (gogles) සඳහා වරක් භාවිත කර ඉවත් කළ හැකි ඖෂධීය මැලියම් පටි විශේෂයක් යොද ගන්නා අතර, එය ඇස් වටා සුමුදුව බැඳෙමින්, කිමිදීමේ දී පවා ජලය ඇතුළට යාම වළකනු ඇත. මෙහි වූ පොලිකාබනේට් කාච යුගල විවෘත ඇසට වඩා සාර්ථකව ජලය තුළ දී ක්‍රියාත්මක වේ. එහෙත් මෙම පිහිනුම් කණ්ණාඩි දැමීම සහ ගැලවීම මදක් ආයාසකර කටයුත්තක් වනු ඇත. මේ වසරේ වසන්ත සමයේ සිට කණ්ණාඩි යුගල ඇ. ඩොලර් 25 කට මිලදී ගත හැකිය.



නිපදවීම :
**Rob broos, Dylan Van Atta**



## සජීවී පියවර

පරිගණක සහිත පාවහන් අසීරු වුවත්, එය විශ්වාස කිරීමට දුන් ඔබට සිදුවේ. අසීරු මාර්ග වඩාත් පහසුවෙන් තරණය කිරීමට මේ පාවහන් අපූරුය. පැය 100 ක් පමණ නොකඩවා ක්‍රියාකාරීව පවතින ලිතියම් - යකඩ බැටරියක් මඟින්, පාවහන්වල සවි කළ පද්ධතියට ශක්තිය සැපයෙන අතර, සෑම පියවරකදීම ඔබ කොපමණ පීඩනයක් සපත්තුවේ අඩිය මත යොදනවා ද යන්න එහි වූ සංවේදක උපකරණයක් මඟින් මිනුම් ගත කෙරෙනු ඇත. ඒ අනුව කුඩා මයික්‍රෝ ප්‍රොසෙසරයක් මඟින් පතුලේ "කුෂනය" පාලනය කර එහි දැඩි බව ක්‍රමානුකූලව සකසනු ලැබේ. ඊට අමතරව සපත්තුවේ වූ බොත්තම් මඟින් ඔබට අවශ්‍ය පහසුකම් සකසා ගත හැකිය. මේ වසරේ මාර්තු මාසයේ සිට ඇ. ඩොලර් 250 ක මිලකට ලබාගත හැකිය.

නිපදවීම : **adidas**

වැඩි විස්තර සඳහා : **adidas.com**

# 2004 වසරේ විශිෂ්ට නිපැයුම්



## පහසුවෙන් පැද යන්න

ලොව පුරා පැවැත්වෙන තරගාවලිවල දී වඩාත් කාර්යක්ෂම ලෙස යොදා ගත හැකි රළ පදිනයක් (Surf Board) නිපදවීමට බ්‍රිතාන්‍යයේ ධීදබඥදත සමාගම සමත් වී තිබේ. මෙහි විශේෂත්වය කුඩා පෙත්තක ප්‍රමාණයේ පරිගණකයක් එය තුළට ඇතුළු කර තිබීම ය. "Wi - Fi" වයර් රහිත තාක්ෂණය යොදා ගනිමින් මෙය නිර්මාණය කර ඇත්තේ එය පැද යන්නාට ඊ-මේල් පණිවුඩ සහ වීඩියෝ දත්ත යැවිය හැකි අයුරිනි. ලබාගත හැක්කේ තවමත් ඡායාරූප ආකාරයෙන් පමණි.

නිපදවීම : Intel

වැඩි විස්තර සඳහා : Intel.com

## සිහින බෝට්ටුව

රිදී පැහැති "Mari - Cha iv", ලොව වේගවත්ම, තනි බඳකින් යුතු සැහැල්ලු රුවල් නැව ලෙස සැලකේ. මෙහි හිමිකරු කෝටිපති රොබට් මිලර් ය. මීටර් 42 ක් දිග, කාබන් ෆයිබර් නිපැයුමක් වූ මෙය, මීටර් 45 ක් දිග කුඹගස් දෙකකින් හා රුවල් 5 කින් සමන්විත ය. මුහුදු සැතැප්ම 36 ක (36 Knots) වේගයෙන් ගමන් ගත හැකිය. එය එම ප්‍රමාණයේම වෙනත් බෝට්ටුවක වේගය මෙන් දෙගුණයකි. "West Marine Pacific" කුසලානය, සැන්ෆ්‍රැන්සිස්කෝ සිට හවායි දක්වා තරගය ඇතුළු ලෝක වාර්තා 4 කට ද මෙය උරුමකම් කියයි. වටිනාකම ඇ. ඩොලර් මිලියන 12.6 කි.

නිපදවීම : **Mari-Cha iv** සැලසුම් කණ්ඩායම

වැඩි විස්තර සඳහා : **mari-chaiv.com**





## බියෙන් තොර - සතුට

ඔබ දිය මත ලිස්සා යෑමේ ක්‍රීඩාවට (Water Skiing) ප්‍රිය කරන්නෙක් නම්, මින් මතුවට බෝට්ටු පදවන්නකු සොයා වෙහෙසිය යුතු නොවේ. මිනිසකු රහිත, මීටර් 2.4 ක් දිග "Solo" ෆයිබර්ග්ලාස් බෝට්ටුව, මැසිවිලි නොනගා ඔබේ පිහිටට එනු ඇත. මෙහි සියලුම පාලන කටයුතු ඔබ අත වූ හැඬල දෙක මඟින් සිදු කෙරෙන අතර, එය වේගය පාලනය කිරීමේ, හැරවීමේ සහ නැවතීමේ බොත්තම් සහිත ය. හදිසියේ හෝ අතින් හැඬලය අතහැරුනහොත්, "Kill" නම් වූ ස්විචය ක්‍රියාත්මක වී බෝට්ටුව අක්‍රිය වේ. පැයට කි. මී. 69 ක වේගයෙන් ගමන් ගන්නා "Solo" ඇ. එ. ජනපදයේ ප්‍රාන්ත 40 ක නීත්‍යානුකූලව භාවිත කෙරේ. ඩොලර් 10,995 ක මිලකට ලබාගත හැකිය.

නිපදවීම : Solo Water Sports

වැඩි විස්තර සඳහා : solowater.sports.com







## රොබෝ සොල්දාදුවා

මෙය කැරලිකරුවන්ට අසුබ ආරංචියක් වනු ඇත. මිනිසෙක් රහිතව ක්‍රියා කරමින්, සන්නද්ධව, පොළොවේ ගමන් කරන මෙම රථය කිසිදු විඩාබර නොවන්නකි. බඩගින්න සහ බිය එයට නුහුරුය. කැමරා 4 ක් මි. මීටර් 7.62 මැෂින් තුවක්කුවක් සහිත මේ රොබෝ වාහනය රාත්‍රී දෘෂ්ටිය සහිතය. එය ගින්නකට විවෘත වන තුරුම නිශ්ශබ්දවය ගමන් කළ හැකිය. සජීවී වීඩියෝ දත්ත කැවීමක් මඟින්, රථයට කිලෝ මීටරයකට වඩා දුර යෑමට එහි ධාවකයාට හැකියාව ලබා දී ඇත. ඇ. එක්සත් ජනපද යුද හමුදාව මඟින් මින් 18 ක් ඇනවුම් කර ඇත්තේ, ඉරාකයේ ඵලදායී ලෙස මෙහෙයවීම සඳහාය. ආරක්ෂක අංශ සඳහා පමණක් ඇ. ඩොලර් 230,000 මිලකට මේ වසරේ සිට ලබා ගත හැකිය.

නිපදවීම : ඇමරිකා එ. ජනපද යුද හමුදාවේ යුද අවි හා යුද උපකරණ පර්යේෂණ, සංවර්ධන හා ඉංජිනේරු මධ්‍යස්ථානය සහ ෆොස්ටර්, මිලර් මැසචුසෙට් ආරක්ෂක ආයතනය.

වැඩි විස්තර සඳහා :
**pica.army.smil,**
**foster- miller.com**



## පාපන්දු ක්‍රීඩකයා

රොබෝවකු දෙපයින් ඇවිදවීම ඉතා අසීරු කටයුත්තකි. ටෝකියෝවේ වෙළෙඳ ප්‍රදර්ශනයකට ඉදිරිපත් කර තිබූ මේ රොබෝවා, හොඳින් ඇවිද පාපන්දුවකට නිවැරදි ඉරියව්වෙන් පහර දීමේ හැකියාව ද පෙන්වීය. නවතම "SHIN" ඇවිදීමේ තාක්ෂණය මඟින් සෙ.මී. 35 ක් උස රොබෝවකුට ගුරුත්ව කේන්ද්‍රය පාලනය කර ගැනීමට මෙන්ම දණහිස නවා නිවැරදි ඉරියව්ව ගැනීමට ද පහසු කරවයි. ලබාගත හැක්කේ ඡායාරූප ආකාරයෙන් පමණි.

නිපදවීම :
කියෝතෝ විශ්ව විද්‍යාලයේ රොබෝ නිෂ්පාදන අංශය



## ආරක්ෂක මදුරු දැල

අප්‍රිකාවේ සිටින භයානක, මැලේරියා වාහක මදුරුවන් හමුවට එන අලුත්ම සතුරා "Olyset" මදුරු දැලයි. වසර 5 ක් පමණ ශක්තිමත්ව පවතින, විශේෂ ප්ලාස්ටික් වියමනක් වූ මෙය කෘමි නාශක පර්මෙත්‍රින් (Permethrin) වලින් සංතෘප්ත ය. මිලෙන් අඩුය. විචිත්‍ර වර්ණයන්ගෙන් ලබාගත හැකිය. දෙර ජනෙල් තිර රෙදි සඳහා ද ඉදිරියේ දී යොදා ගැනීමට නියමිතය. ඇතැම් සහන සමාගම් සහ සායන මඟින් නොමිලේ හෝ ඇ. ඩොලර් 7 - 8 දක්වා මිලකට දැන් ලබාගත හැකිය.

නිපදවීම : Sumitomo Chemical

වැඩි විස්තර : acumenfund.org

## පහසුවෙන් ඇවිදින්න




"Rheo"දණහිසට පිත්සිදුවත්තට, දණහිසින් පහළ පාදය රහිතව ඉරාකයේ සිට පැමිණෙන ඇමරිකානු සොල්දදුවන්ට පාද ලබා දීම මේ දිනවල ශීඝ්‍රයෙන් සිදු කෙරේ. අයිස්ලන්තයේ නිෂ්පාදිත මෙම නව කෘත්‍රිම සන්ධිය සැලසුම් කර ඇත්තේ චලනය පිළිබඳ හැඟීමක සියුම් වෙනස පවා හඳුනාගෙන ඒ අනුව තනිව තමා ම හැඩ ගැසෙන පරිදි ය. පරිගණක කීපයකින් හා මෘදුකාංගයකින් යුතු සංවේදකය සැදූ නවීකරණය කළ පාලක මොඩියුලය මඟින් දරා සිටින්නාගේ ගමන් ලීලාවේ සිදුවන වෙනස්කම් වලට ක්ෂණික ප්‍රතිචාර දක්වනු ලැබේ. එමඟින් උකුල සහ පසුපස පෙදෙස වෙහෙසට පත්වීම අඩු කෙරේ. තෝරාගත් සායනවලදී දැන් ලබාගත හැකිය.

නිපදවීම **Ossur MIT**

වැඩි විස්තර සඳහා :
**Ossur Com**




## විෂබීජ නසන්නා

ඔබේ දත් බුරුසුවේ පවිත්‍රතාව පිළිබඳ ඔබ සෑහීමකට පත්වනවාද? බැක්ටීරියා වර්ධනයට අතිශය යෝග්‍ය මාධ්‍යයක් වූ දත් බුරුසුව සේදීමෙන් පමණක් පිරිසුදු කරගත නොහැකිය. "Violight" දත් බුරුසු ආරක්‍ෂක රඳවනය, දත් මීට විසඳුමක් වනු ඇත. වරකට දත් බුරුසු 4 ක් රැඳවිය හැකි මේ උපකරණය තුළට ඔබේ බුරුසුව ඇතුළු කර එහි වූ බොත්තම ඔබන්න. එවිට විහිදෙන අධෝරක්ත ආලෝක කිරණ මඟින් මිනිත්තු 10 ක් වැනි කෙටි කලක් තුළ දී බුරුසුවේ වූ විෂබීජ සහ බැක්ටීරියා 99.9% ක් විනාශ කර දමනු ඇත. ඇ. ඩොලර් 49.95 මිලකට ලබාගත හැකිය.

නිපදවීම : **Violight**

වැඩි විස්තර සඳහා : **violight.com**


## එන්නත් කටුවට ආයුබෝවන්

HIV ආසාදිතයෙක් දැයි පරීක්‍ෂා කිරීම පහසු කටයුත්තක් නොවේ. නව "Ora Quick Advance" මඟින් දැන් එම අපහසුව මග හැරෙනු ඇත. මෙම උපකරණය යම් පුද්ගලයකුගේ ඉහළ සහ පහළ විදුරුමස් තුළින් නිදර්ශකයක් ලබා ගැනීම පහසු කරවන අතර, එය මෙහි වූ දියර කුප්පිය තුළට ඇතුළු කිරීමෙන් HIV-1 හා HIV - 2 වයිරස සඳහා ප්‍රතිදේහ තිබේදැයි මිනිත්තු 20 කදී පරීක්‍ෂා කළ හැකිය. මෙහි දී කූර මත රතට හුරු දම් පැහැ ඉරි දෙකක් සටහන් වීම මඟින් ධන ප්‍රතිඵල ලැබෙනු ඇත. මෙහි නිරවද්‍යතාව 99% කි. සායන මඟින් මිල නියම කරනු ඇත.

නිපදවීම : **Orasure**

වැඩි විස්තර සඳහා : **orasure.com**






## හොඳින් අසන්න

ජංගම දුරකථනයකට ලැබෙන ඇමතුම් තැන තැන බිඳවැටීම පැහැදිලි කතා බහට බාධාවකි. මේ අවහිරය මග හරවා ගැනීමට දැන් "Jawbone" "හෙඩ් සෙට්" එකක් භාවිත කළ හැකිය. මෙහි ඇති සංවේදකය කම්මුල් අස්ථිය මත පිහිටන අතර, ඔබ කතා කරන විට ඔබේ හිසෙන් නිකුත්වන සංවේදන කම්පන එමගින් ග්‍රහණය කරගනු ලැබේ. පසුව මෙම දත්ත යොදා ගනිමින් වටාපිටාවේ වූ ශබ්ද පෙරා ඉවත් කෙරෙන අතර, පැහැදිලි හඬ පමණක් අනෙක් පස සිටින තැනැත්තාට ඇසෙන්නට සැලසේ. ඇ. ඩොලර් 150 ක මිලකට දැන් ලබාගත හැකිය.

නිපදවීම : **Aliph**

වැඩි විස්තර සඳහා : **jawbone.com**




## වලාකුළුන අතරමංව

ස්වීඩන් ජාතික මෝස්තර නිර්මාණ ශිල්පිනී මොනිකා ෆෝස්ටර් සිහින මැව්වේ වලාකුළකට ඇතුළු වී එය දැකබලා ගැනීමටය. වලාකුළු පිළිබඳ වැඩිදුර හැදෑරීමෙන් පසු ඈ එම සිහිනය සැබෑ කර ගත්තාය. ඒ ස්වාභාවික වලාකුළක ආකාරයේ නයිලෝන් වලාකුළක් නිර්මාණය කිරීමෙනි. උසින් මීටර් 2 හා දිගින් මීටර් 5 ක් වූ මෙහි බර කි. ග්‍රෑම් 15 කි. මෙහි දී එය දරා සිටින ආවරණය තුළ වූ පංකාව මගින් මිනිත්තු 3 ක කාලයක් හුළං පිරවීම සිදු වේ. ඇ. ඩොලර් 5,900 ක මිලට දැන් ලබාගත හැකිය.

නිපදවීම : මොනිකා ෆොස්ටර්

වැඩි විස්තර සඳහා : **urbanpeel.com**



## අරුම පුදුම කොන්ක්‍රීට්

සිමෙන්ති සහ වීදුරු එකතුව! බැලූ බැල්මට සිදුවිය නොහැකිය. එහෙත් හංගේරියානු ගෘහ නිර්මාණ ශිල්පී Aron Losonczi සිදු කළේ ද එයමය. "Call - Li Tra Con" විනිවිද පෙනෙන අපූරු කොන්ක්‍රීට්, සෙ.මී. 5 තහඩුවල සිට වඩාත් පළල ඒවා දක්වා දැන් ලබාගත හැකිය. සාමාන්‍ය කොන්ක්‍රීට් මෙන් ම ශක්තිමත් මේවා, බිත්ති, ගෙබිම හෝ මූර්ති නිමවීමට යෝග්‍යය. ඝන මීටරයක මිල ඇ. ඩොලර් 65,000 කි.

නිපදවීම : **Li Tra Con**

වැඩි විස්තර සඳහා : **litracon.com**

ටයිම් ඇසුරෙනි
**ලලනී**
කවරයේ
පසු පිටුව බලන්න

# Space Ship One ගමන් අරඹයි


## මිනිසා අභ්‍යවකාශයට සවාරි යෑමේ දිනය වැඩි ඈතක නොවනු ඇත



1 "White Knight" මව් යානය හා බද්ධ වූ Space Ship One යානය කැලිෆෝනියාවේ "Mojave" ප්‍රදේශයෙන් ගුවන් ගත වේ.




2 මීටර් 14,600 උසක දී ගුවන් ගත වී පැයකට පසු මව් යානය මඟින් අභ්‍යවකාශ යානය නිදහස් කෙරේ.






4 නැවත පෘථිවි වායුගෝලයට පිවිසීමට සූදානම් වෙමින් යානය ස්ථායීව පවත්වා ගැනීම සඳහා 65° ක කෝණයකින් එහි පියාපත් ඉහළට එසැවේ.



5 පෘථිවියට ළඟාවන යානය, රෝද දිග හරිමින් ගොඩබැස්සවීමට සූදානම් වේ. මුළු ගමන් කාලය පැය [illegible]